යෝජනා ක්‍රමයට අයත් ප්‍රදේශය තුල 1977 වසර අවසන් වන විට පවුල් 5,544 ක් පදිංචි කොට ඇත. පළමුවන අදියර යටතේ සංවර්ධන කටයුතු නිමවූ විට අළුත් ඉඩම් අක්කර 91,000 කට වාරිමාර්ග පහසුකම් සැලසෙනු ඇත.

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ ප්‍රධාන සැලැස්මට අනුව තිබූ සියළුම වැඩ කටයුතු අවුරුදු 5 6 දක්වා කාලයක් තුලදී නිම කිරීමේ අදහසින් සංවර්ධන කටයුතු කඩිනම් කිරීමට 1977 නොවැම්බර් මාසයේදී රජය විසින් තීරණය කරන ලදී. මෑතම තොරතුරුවලින් පැහැදිලි වන අන්දමට රුපියල් දශලක්ෂ 11,000 ක සම්පූර්ණ ආයෝජනයකින් 1978-82 කාලය තුලදී ක්‍රියාත්මක කෙරෙන තවදුරටත් සංශෝධිත වැඩපිළිවෙලක් රජය විසින් අනුමත කර තිබේ.

## කාර්මික නිෂ්පාදනය

1977 දී, කාර්මික නිෂ්පාදනයෙහි මුලු වටිනාකම 1976 පැවති රුපියල් දශ ලක්ෂ 6061 සිට රුපියල් දශ ලක්ෂ 7004 දක්වා සියයට 16 කින් වැඩිවූ බව ඇස්තමේන්තු කෙරී ඇත. කෙසේ වුවද, මූර්ත වශයෙන් කාර්මික නිෂ්පාදනය ඉහළ ගියේ සියයට 1·3 කින් වන අතර, කර්මාන්තවල එකතු කළ අගය වැඩිවූයේ සියයට 1·1 කිනි. මේ හා සසඳන කල කාර්මික අංශයේ මූර්ත වර්ධනය 1975 දී සියයට 3·2 කින් ද, 1976 දී සියයට 1·2 කින් ද සිදුවී තිබුණි.

1976 දී නිමැවුමේ වර්ධනය සිදුවූයේ ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථාවල නිෂ්පාදනය තුළින් වුවද, 1977 දී සිදුවූ ඉහළයාම මූලික වශයෙන්ම පෞද්ගලික අංශය තුළින් සිදුවිය. 1977 දී පෞද්ගලික අංශයේ නිෂ්පාදනය ඉහල නැගී අතර, රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථාවල නිමැවුම පහලයාමක් දක්නට ලැබිණ. වැඩිපුර විදේශ විනිමය ලබාගත හැකිවීම පෞද්ගලික අංශයේ නිෂ්පාදනය ඉහළ මට්ටමකට පත්කිරීමට ඉවහල් වූ කරුණක් විය. දේශීය අමුද්‍රව්‍ය වඩා සුලභ වීමද එයට බලපෑ බව සංඛ්‍යා දත්ත වලින් පෙනීයයි.

**සංඛ්‍යා ලේඛන 7**

**කාර්මික නිෂ්පාදනයේ වටිනාකම 1975 – 1977**

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රු: දශ ලක්ෂ) | | |
|---|---|---|---|
| | 1975 | 1976 | 1977 |
| 1· ආහාර පාන වර්ග හා දුම්කොළ | 1503 | 1715 | 2294 |
| 2· රෙදිපිළි ඇඳුම් හා සම්භාණ්ඩ | 892 | 680 | 698 |
| 3· දැව සහ දැව භාණ්ඩ (ගෘහභාණ්ඩ ඇතුලුව) | 115 | 129 | 127 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ | 270 | 203 | 270 |
| 5· රසායන ද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ | 2002 | 2336 | 2469 |
| 6· ලෝහ නොවන ඛනිජ භාණ්ඩ | 244 | 360 | 411 |
| 7· මූලික ලෝහ නිෂ්පාදන | 128 | 138 | 132 |
| 8· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 381 | 474 | 571 |
| 9· අනිකුත් නිෂ්පාදන | 20 | 26 | 34 |
| 10· එකතුව | 5556 | 6061 | 7004 |
| 11· වර්ධනයේ මූර්ත අනුපාතය (%) | 3·2 | 1·2 | 1·3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

නිෂ්පාදනය අතින් සිදුවූ මඳ වර්ධනය පිළිබිඹු කරමින් කාර්මික නිෂ්පාදන අංශයෙහි සේවා නියුක්තිය ඉහළ ගියේ සියයට 2 කිනි. ධාරිතාව ප්‍රයෝජනයට ගැනීම අතින් සියයට 7 ක වැඩිවීමක් වාර්තා කෙරුණි. මුළු අමුද්‍රව්‍ය පරිභරණය තුළ වූ විදේශීය අමුද්‍රව්‍ය ප්‍රමාණය, 1976 පැවති සියයට 70 සිට 1977 දී සියයට 66 දක්වා අඩුවීමෙන් දේශීය අමුද්‍රව්‍ය වඩාත් යොදගැණුන බව පෙනී ගියේය.

කාර්මික අපනයනවල 1976 පැවති ඉහළ වර්ධන අනුපාතිකය පවත්වා ගැනීමට නොහැකි විය. කාර්මික නිෂ්පාදනයේ මුලු වටිනාකමෙන් අපනයනය කෙරුන ප්‍රමාණය 1976 පැවති මට්ටමෙහිම, එනම් සියයට 13 ක් ලෙස 1977 දී ද පැවතුනි. සිමෙන්ති සහ රසායන ද්‍රව්‍ය වැනි නිෂ්පාදනයන්හි අපනයන දැඩිසේ පහත වැටීම සිදුවිය. ටින් කළ පළතුරු, කොකෝවා නිෂ්පාදන, රෙදිපිළි සහ ඇඳුම් වර්ග, පාවහන්, දැව නිෂ්පාදන සහ යන්ත්‍ර, යාන්ත්‍රික උපකරණ වල අපනයන ඉහළයාමක් වාර්තා කෙරුණි.

1977 දී කාර්මික නිෂ්පාදනය ව්‍යාප්ත වීම මූලික වශයෙන්ම සිදුවූයේ පුළුල් කාර්මික නිෂ්පාදන ගණ තුනකය. එනම්, අනු පිළිවෙලින්, ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදනය, කඩදසි හා කඩදසි නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ යන නිෂ්පාදන අංශයන්හිය. ඉහතින් දැක්වෙන සංඛ්‍යා සටහනෙන් මේ බව විදහා දැක්වේ.

ඉහළම වර්ධන අනුපාතිකය හටගත්තේ ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයෙහිය. ඒ අනුව, මුළු කාර්මික නිෂ්පාදන වටිනාකමෙහි මෙම නිෂ්පාදනයන් ඉසුලූ සාපේක්ෂ වැදගත්කම 1976 පැවති සියයට 28 සිට 1977 දී සියයට 33 දක්වා ඉහළ නැගුණි. මෙම අංශය වඩාත් ශ්‍රම සූක්ෂම එකක් වීමෙන් රැකියා අවස්ථා පෑදීමටද ඉවහල් වූ බව පෙනේ. ටින් කළ පළතුරු සහ කොකෝවා නිෂ්පාදිත අපනයනයන්හි සෑහෙන වැඩිවීමක් හටගති. ප්‍රධාන කාර්මික ගණ නවය අතරින් ආනයනය කළ අමුද්‍රව්‍ය අඩුවෙන්ම යොදවන අංශය මෙය වීම වැදගත් කරුණකි.

කඩදසි සහ කඩදසි නිෂ්පාදිතවල නිමැවුම සැළකියයුතු ලෙස ඉහළ ගියේය. 1976 දී මෙම කාර්මික අංශයේ නිමැවුම දැඩිසේ පහළ ගියේ ආනයනය කළ අමුද්‍රව්‍ය හිඟ වීම සහ නිෂ්පාදනයට අවශ්‍ය ජලය සැපයීම පිළිබඳව හටගත් දුෂ්කරතා හේතුවෙනි. 1977 දී ආනයනය කළ අමු ද්‍රව්‍ය වඩාත් බහුල ලෙස ලබාගත හැකිවීම නිෂ්පාදනය නැංවීමට උපකාරි විය. මෙම අංශයද, ශ්‍රම සූක්ෂම එකක් වූ අතර, රැකියා අවස්ථා සැපයීම අතින් 1977 දී ඉහළම තැනක් ලබාගත් බව පෙනුණි. ධාරිතාව ප්‍රයෝජනයට ගැනීම අතින් සියයට 20 ක පමණ ඉහළ යාමක්ද මෙම අංශයෙහි දක්නට ලැබුණි.

සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනයන්හි පුළුල් වීමක් 1977 දී සිදු විය. කෘෂිකාර්මික උපකරණ සහ මෝටර් රථ කොටස් වැනි නිෂ්පාදන කීපයකම නිමැවුම සෑහෙන පමණ ඉහළ ගියේය. එමෙන්ම යන්ත්‍ර සූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ අපනයනය කිරීමෙහිද කැපීපෙනෙන වැඩි වීමක් 1977 දී සිදුවිය.

එක් පසෙකින් ඉහත සඳහන් කළ කර්මාන්ත ගණයන්හි නිමැවුම ඉහළ ගිය අතර, අනෙක් පසින් මූලික ලෝහ භාණ්ඩ නිෂ්පාදිත සහ දැව හා දැව නිෂ්පාදිතවල නිමැවුම පහත වැටීමක් සිදුවිය. එයට බොහෝදුරට හේතුවූයේ, 1977 දී ලංකා වානේ සංස්ථාවේ සහ ලංකා තුනී ලෑලි සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදනය අඩු මට්ටමක පැවතීමය. මෙකී කර්මාන්ත වල, ධාරිතාව ප්‍රයෝජනයට ගැනීම සහ එකතු කළ අගය 1976 දී පැවති තත්ත්වයනට වඩා පහත වැටුණි.

දේශීය වෙළෙඳපොලේ සීමාසහිත බව කාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීම වැළකූ ප්‍රධාන බාධකයක් විය. එමෙන්ම දිගින් දිගටම දැඩිසේ ආරක්ෂාව සැලසීමත්, ආනයන භාණ්ඩ හා තරඟ කිරීමට සිදු නොවීමත්, බලපත්‍ර හා පාලන නීති වැනි දුෂ්කරතාවනට භාජන වීමත්, යනාදිය හේතුකොටගෙන අපනයන කිරීම සඳහා යෝග්‍ය ලෙස ගුණාත්මක අතින් හා

කාර්යක්ෂමතාවය අතින් දියුණු වීමට දේශීය කර්මාන්තවලට අපහසු විය. එමෙන්ම, විදේශීය වෙළෙඳපොලවල ඉඩකඩ ලබාගැනීම සම්බන්ධයෙන්ද මැනවින් දන්නා දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවිය. මේ අනුව සලකන කල, 1977 අය වැය කථාවෙහි යෝජනා කරන ලද පරිදි, නිදහස් ආනයන වැඩපිළිවෙල මගින් බොහෝ අමුද්‍රව්‍ය ආනයන පිළිබඳ පැවති බලපත්‍ර ක්‍රමය ඉවත් කිරීම සහ රුපියල් 7,00,000 ට වැඩි නොවන යන්ත්‍ර සූත්‍ර රජයේ පූර්ව අනුමැතියක් රහිතව ආනයනය කිරීමට ඉඩදීම වැනි ප්‍රතිපත්ති, මීට ඉහතදී පැවති ප්‍රතිපත්තිවලට වඩා විශාල වෙනස්කමකින් යුක්ත බව කිව හැක. තවද, මෑතකදී පිහිටවූ මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති කෙරෙන අපනයන ද්‍රව්‍ය සකස් කිරීමේ කලාපය මගින්, අපනයනය කෙරෙහි යොමු වූ කර්මාන්ත වඩා නිදහස් වාතාවරණයක් තුළ දියුණු කිරීමට ඉඩකඩ සැලසෙනු ඇත. මෙකී යෝජනා තුළින් වඩා සීඝ්‍ර වර්ධනයක් කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ඇතිවේයයි බලාපොරොත්තු වේ. සමස්තයක් ලෙස ගත්කල, 1977 දී පෙනිගියේ ආනයන ආදේශනය මත පදනම් වූ කර්මාන්ත ක්‍රමයක් අපනයනය මුල් කරගත් කර්මාන්ත සංවර්ධනය සඳහා යොමු කෙරෙන අන්දමින් මෙරට කර්මාන්ත ප්‍රතිපත්තියේ ඇතිවූ මූලික වෙනසකි.

## මිල

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමෙහි ඇතිවන වෙනස්කම් මැනීම සඳහා මෙතෙක් භාවිතා කරනු ලැබූ එකම දර්ශකය වූ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය අනුව 1977 වර්ෂය තුල මිල මට්ටම සියයට 1·2 කින් වැඩිවී ඇත. මෙම දර්ශකය අනුව 1976 වර්ෂයේ දී ද මිල මට්ටමේ වර්ධනය සියයට 1·2 ක් වූ අතර 1975 දී එය සියයට 6·7 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ පසුගිය වාර්ෂික වාර්තාවල සඳහන් කළ පරිදි කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ පවතින දැඩි ඌනතාවන් නිසා එය ආර්ථිකයේ මිල මට්ටමේ වෙනස්වීම් මැනීමට සුදුසු මිණුමක් නොවේ.

මිල මට්ටමෙහි වෙනස්වීම් මැනීම සඳහා වඩා තාත්වික දර්ශකයක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 1974 පාද වර්ෂය වශයෙන් යොදා ගනිමින් 1977 දී තොග මිල දර්ශකයක් ගණනය කරන ලදී. මෙම මිල දර්ශකය පාරිභෝගික මට්ටමේදී ඇතිවන මිල වෙනස්වීම් මැනීමක් නොකළත් පාරිභෝගික මිල දර්ශකයට වඩා මිල මට්ටමේ වෙනස්වීම් තක්සේරු කිරීම සඳහා යෝග්‍ය වේ. පාරිභෝගික මිල දර්ශකයෙන් පෙන්නුම් කරන ලද 1977 වර්ෂයේ මිල මට්ටමේ වැඩිවීම වූ සියයට 1·2 සමග සසඳන විට තොග මිල දර්ශකය සියයට 31 ක වැඩිවීමක් දක්වයි. 1976 දී තොග මිල දර්ශකයේ වැඩිවීම සියයට 8 ක් වූ අතර එය 1975 දී සියයට 3 ක් විය. අනෙක් අතට වර්තන මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සහ 1959 යේ ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතිකය වූ ගම්‍ය මිල දර්ශකය 1977 වර්ෂය තුල සියයට 16 ක ඉහළ නැගීමක් පෙන්නුම් කරයි. මෙය 1976 දී සියයට 7 ක්ව පැවැති අතර 1975 දී සියයට 8 ක්ව පැවතිණි. තොග මිල දර්ශකය හා ගම්‍ය මිල දර්ශකය නිර්යාත මිල සඳහා වැඩි බර තැබීමක් කරන අතර නිර්යාත මිල ගණන් 1977 වර්ෂයේ දී සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වූ බව සඳහන් කිරීම වැදගත් වේ. එහෙයින් පාරිභෝගික මිල මට්ටමේ ඇතිවන වෙනස්කම් මැනීම සඳහා මෙවැනි දර්ශකයන් උපයෝගී කරගන්නේ නම් අපනයන මිල සඳහා ඇති වැඩිවීමක් දක්වන අභිනතිය වට්ටම් කළයුතු වේ. සමස්තයක් ලෙස සලකන විට 1977 වර්ෂය තුල පාරිභෝගික මිල සියයට 12 සිට 15 දක්වා වූ ප්‍රමාණය කින් ඉහළ ගිය බව තක්සේරු කිරීම සාධාරණ වේ.

ඉහතින් සඳහන් කළ 1977 වර්ෂය සඳහා වූ මිල මට්ටමේ වෙනස්වීම් අධ්‍යයනය කිරීමේදී වර්ෂය තුල මුදල් සැපයුමේ සියයට 29 ක වර්ධනයත් සියයට 23 ක් වූ ආනයන මිල දර්ශකයේ වැඩිවීමත් සියයට 9 ක් වූ මූල්‍ය වැටුප් මට්ටමේ ඉහල යාමත් සැළකිල්ලට භාජනය කළ යුතුය. තවද පොලී ප්‍රමාණයේ සාමාන්‍ය වැඩිවීම සහ 1977 නොවැම්බර් මාසයේ දී ලංකා රුපියල පාවෙන්නට ඉඩ හැරීමෙන් අවසාන වූ අගෝස්තු මස සිට ක්‍රමානුකූලව මුදලේ වටිනාකම අවප්‍රමාණය වීම ද මිල මට්ටම කෙරෙහි බලපා තිබේ. ශ්‍රී ලංකා රුපියල සඳහා ඇති කළ ඒකීය විනිමය අනුපාතික ක්‍රමයේත්, නිදහස් වෙළෙඳ ක්‍රමයේත් මිල කෙරෙහි ඇතිවූ